සංවර්ධන ලොතරැයි මණ්ඩලය
அபிவிருத்தி லொத்தர் சபை
DEVELOPMENT LOTTERIES BOARD
MINISTRY OF FINANCE

DLB
DEVELOPMENT LOTTERIES


DLB/PRO/600
2024.07.04

...........................................................................

...........................................................................

...........................................................................

...........................................................................

## <u>භාවිතයෙන් ඉවත් කරන ලද අබලි ටයර් අලෙවි කිරීම</u>

පොදු කොන්දේසි -

1. මෙම ආයතනයේ භාවිතයෙන් ඉවත් කරන ලද පහත සදහන් ටයර් වර්ග අලෙවි කිරීම සදහා මේ පිළිබදව උනන්දුවක් දක්වන්නන්ගෙන් මිල ගණන් කැදවනු ලැබේ.

| ලොට් අංකය | අබලි ටයර් පිළිබඳ තොරතුරු | ටයර් ප්‍රමාණය | ආපසු ගෙවන ඇප තැන්පතු මුදල (රු.) |
|---|---|---|---|
| 01 | 195 R 15 | 29 | 10,000.00 |
| 02 | 185 R 14 | 21 | |
| 03 | 700 R 15 | 09 | |
| 04 | 650 R 15 | 01 | |
| 05 | 165 R 13 | 01 | |
| 06 | 400 R 08 | 01 | |
| | මුළු ටයර් ගණන | 62 | |

2. භාණ්ඩ පරීක්ෂාව 2024.07.05 සිට 2024.07.18 දින පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාලීය දින වලදී මෙම කාර්යාල පරිශ්‍රයේදී සිදු කල හැක. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ඉහත උප ලේඛනයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදලක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මුදල් අයකැමි වෙත ගෙවා ලබාගත් ලදුපතේ පිටපතක් මිල ගණන් පත්‍රිකාව සමඟ ඉදිරිපත් කල යුතුය. **එම ඇප තැන්පතු මුදල නොගෙවීම ලංසු අවලංගු වීමට හේතුවනු ඇත.ලංසු පැවරීමෙන් පසු ඇප තැන්පතු මුදල නිදහස් කරනු ලැබේ.**

3. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි කට්ටලය <u>සභාපති,සංවර්ධන ලොතරැයි මණ්ඩලය අංක356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.</u> ලිපිනයට 2024.07.18 දින ප.ව 2.30 ට පෙර ලැබෙන සේ හෝ ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ එම ලිපිනයෙහි පිහිටි ප්‍රසම්පාදන අංශයේ මේ සදහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනැවිත් බහාලිය හැකිය.

4. එක් ඉල්ලුම්කරුවකුට එක් මිල ගණන් පත්‍රිකාවක් පමණක් ඉදිරිපත් කළ හැක. මෙම ලිපියේ සඳහන් පරිදි සියළුම ලොට් වලට හෝ තෝරාගත් ලොට් වශයෙන් මිල ගණන් ඉදිරිපත් කල හැක.ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් වලට අමතරව 2.5% SSCL බදු හා 18% ක VAT බදු ගෙවිය යුතු අතර එම කරුණු ද සැලකිල්ලට ගෙන මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

5. ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ **"අබලි ටයර් අලෙවි කිරීම සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කල යුතුය.

6. ලංසු විවෘත කිරීම 2024.07.19 ප.ව 2.30 ට මෙම කාර්යාලයේදී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

7. ලංසු පැවරීමේදී එක් එක් ලොට් අංකය වෙන වෙනම සැලකිල්ලට ගෙන ලංසු පැවරීම සිදු කෙරේ.

8. ඔබගේ මිල ගණන් මේ සමඟ අමුණා ඇති පෝරමය මගින් පමණක් ඉදිරිපත් කලයුතුය.

9. ලංසුකරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලංසු ලියවිලි කට්ටලයේ දක්වා ඇති අයිතමයන් ඉදිරියෙන් අකුරින් හා ඉලක්කමින් සඳහන් කල යුතු අතර එම මිල ගණන් වල නොගැලපීමක් පැවතිය හොත් අකුරින් ලියන ලද මිල ගණන නිවැරදි මිල සේ සලකා කටයුතු කරනු ලැබේ.

10. සාර්ථක ලංසුකරුවන් වෙත ලංසු ප්‍රධානය කිරීම ලිඛිතව නිවේදනය කරනු ලැබේ. එම ලිපියේ සඳහන් දින සිට දින 07 ක් ඇතුලත මිලදී ගැනීමේ වටිනාකම මෙම කාර්යාලයට මුදලින් ගෙවා අදාල භාණ්ඩ ඉවත් කර ගත යුතුය. එසේ ඉවත් නොකර ගැනීමකදී තබා ඇති ආපසු ගෙවන ඇප තැන්පතු මුදල මණ්ඩලය සතු කෙරේ.

11. ලංසු ප්‍රධානය ලැබූ ලංසුකරුවන් ලංසු කොන්දේසි කඩ කලහොත් හෝ ඊට අනුකූල නොවී කටයුතු කරන්නේ නම් ආපසු ගෙවන ටෙන්ඩර් ඇප මුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලය සතු කිරීමට කටයුතු කෙරේ.

12. තෝරාගත් ගැනුම් කරුවන් කාර්යාල පරිශ්‍රයට පැමිණීමෙන් පසුව ආයතනයේ පනවා ඇති නීති රීති වලට අනුකූලව කටයුතු කල යුතු අතර ආයතනයේ අනෙකුත් රාජකාරී කටයුතු වලට බාධා නොවනසේ සිය සහායකයන් හසුරුවා ගැනීමට වග බලා ගත යුතුයි.

13. කාර්යාලීය වේලාව තුල හැර පිටස්තර වේලාවන්හිදී භාණ්ඩ ඉවත් කර ගැනීමට ඉඩ නොදේ. ගැනුම්කරුවන්ට පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා පමණක් කාර්යාල පරිශ්‍රයේ රැදී සිටිය හැකි අතර ලංසුකරුවන් සහ ඔවුන්ගේ සහායකයින් කාර්යාල පරිශ්‍රයෙන් ප.ව 3.00 පෙර ඉවත් විය යුතුයි.

14. අලෙවි කරන ලද භාණ්ඩ පැටවීමේදී හා ආයතන භූමියෙන් පිටතට රැගෙන යාමේදී සිදුවන යම් අනතුරකින් ආයතනයේ දේපලකට අලාභ හානියක් සිදු වුවහොත් එම අලාභය තක්සේරු කර බලා ගැණුම්කරුගෙන් අයකර ගන්නා තුරු අලෙවි භාණ්ඩ බැහැර කිරීමට අවසර දෙනු නොලැබේ.

15. ගැණුම්කරු විසින් සිය ලංසු ප්‍රධානය අන්සතු නොකල යුතුය. ගැණුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කර බැහැර ගෙන යාමේ ගේට්ටු අවසර පත්‍ර නිකුත් කරන බැවින් ලංසුව අන්සතු නොකල යුතු වේ.

16. මේ පිළිබඳව යම් වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම් අංක 076-9475871 / 011-4824824 මගින් සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) ඇමතීමෙන් ලබාගත හැකිය.

සභාපති,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත,
යුනියන් පෙදෙස, කොළඹ 02.
011-4824824
2024.07.03

# මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය

සභාපති,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත,
යුනියන් පෙදෙස, කොළඹ 02.

## අබලි ටයර් අලෙවි කිරීම

01. ඉල්ලුම්කරුගේ නම : - ............................................................................................................

(පුද්ගල නාමය හෝ ආයතනික නාමය)

02. ස්ථිර ලිපිනය : -.................................................................................................

03. හැඳුනුම් පත් අංකය :-.....................................................................................................

04. දුරකථන අංකය :- ජංගම:............................... ස්ථාවර:...............................................

05. ආපසු ගෙවන ඇප තැන්පතු ගෙවුම් රිසිට් පත් අංකය :- ..................................................

මුදල :- ..................................................

06. මිලට ගැනීමට අපේක්ෂිත මිල ගණන් පහත ඇමුණුම 01 හි සඳහන් කරන්න : -

| ලොට් අංක | ටයර් වල ප්‍රමාණය | | එක් එක් ලොට් අංකයට අදාළ මුළු ටයර් ප්‍රමාණය මිලට ගැනීම සඳහා වන මුළු වටිනාකම | |
|---|---|---|---|---|
| | | | ඉලක්කමෙන් රු. | අකුරින් |
| 01 | 195 R 15 | 29 | | |
| 02 | 185 R 14 | 21 | | |
| 03 | 700 R 15 | 9 | | |
| 04 | 650 R 15 | 1 | | |
| 05 | 165 R 13 | 1 | | |
| 06 | 400 R 08 | 1 | | |

- **සටහන :- ඉහත සඳහන් මිල ගණන් වලට අමතරව 2.5% SSCL බදු හා 18% VAT බදු ගෙවීමට සිදු වන බව සලකන්න.**

ඉහත සියළුම තොරතුරු නිවැරදි බවත්, ලංසු කොන්දේසි කියවා බලා ඊට අනුකූලව කටයුතු කිරීමට මාගේ එකඟතාවය මින් පලකරමි.

.................................... ...............................................

දිනය ලංසුකරුගේ අත්සන